# ඉඩම් නොමැති රණවිරුවන්ගේ පදිංචිය සඳහා රජයේ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය.

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය වෙනුවෙන් ක්‍රියාන්විත සේවයේ යෙදී සිටි දිවිපිදූ, අතුරුදහන් වූ හා ආබාධිත වූ ත්‍රිවිධ හමුදා සහ පොලිස් දෙපාර්තමේන්තුවේ රණවිරුවන් සහ ඔවුන්ගේ යැපෙන්නන් රැකබලා ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව විවිධ වූ සුභසාධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව ඔවුනට පදිංචිය සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් කොටසක් ලබාදීමේ ප්‍රතිපත්තිය දැනටමත් ක්‍රියාත්මක වේ. මෙසේ ඉඩම් ලබා දීමේදී දැනට පවතින ක්‍රමවේදයේ පහත සඳහන් අඩුපාඩු මග හරවා ගැනීම සඳහා, පවත්නා ප්‍රතිපත්තිය සංශෝධනය කල යුතු බව ඉඩම් අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව සහ රණවිරු සේවා අධිකාරිය ඇතුළු සියළු පරදූ දරන ආයතන (stakeholders) විසින් එක්ව හඳුනාගෙන ඇත.

I. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී මියගිය සහ පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වූ සෙබළුන්ගේ පවුල්වල සාමාජිකයින්ට දැනට හිමිවන සහනය ප්‍රමාණවත් නොවීම.

II. යුද්ධයේදී ක්‍රියාකාරී සේවයක් ඉටු කරන ලද සිවිල් ආරක්ෂක සේවයේ සෙබළුන් මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් ලෙස මෙතෙක් හඳුනාගෙන නොසිටීම.

III. ඉඩම් ලබාදීම සඳහා අයදුම්පත් කැඳවීම සහ ඊට අදාලව නිර්දේශ ලබා දිය යුතු ආයතන පිළිබඳව පැහැදිලිතාවයක් නොතිබීම.

## 2. සංශෝධිත ක්‍රියාපටිපාටිය

ඉහත සඳහන් අඩුපාඩු මගහරවා ගැනීම සඳහා දැනට පවතින ප්‍රතිපත්තියට පහත සඳහන් සංශෝධන ඇතුළත් කර රණවිරුවන් සඳහා සහනදායී පදනම මත රජයේ ඉඩම් ලබාදීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් (2016.08.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව) ඉඩම් කොමසාරිස් ජනරාල්ට බලය පවරා ඇත. රණවිරුවන් සඳහා රජයේ ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් මීට පෙර ලබා දී ඇති තීරණ මේ මගින් සංශෝධනය වී ඇත.

### 2.1. ප්‍රතිලාභ -

පදිංචියට ඉඩමක් නොමැති හා 2009.06.01 දිනට පෙර සේවයට බැඳී ඇති නිලධාරීන් හා සෙබළුන්ටත් මියගිය එවැනි නිලධාරීන් හා සෙබළුන්ගේ පවුලේ යැපෙන්නන්ටත් මෙම වැඩසටහන යටතේ සහන/ප්‍රතිලාභ හිමි වේ.

පහත සඳහන් ආකාරයට මෙම ප්‍රතිලාභ හිමිවේ.

අ) ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී මියගිය හෝ අතුරුදහන් වූ රණවිරුවන්ගේ පවුලේ ලඟම ඥාතියකුට (විවාහක නම් කලත්‍රයාට හෝ කලත්‍රයා නොමැතිනම් අවිවාහක එක් දරුවකුටත්, අවිවාහක නම් මව හෝ පියාටත්) සහ ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වූ රණවිරුවන්ට පදිංචිය සඳහා සාමාන්‍යයෙන් ඉඩම් බෙදා දීමේදී සැලකිල්ලට ගනු ලබන ඉඩම් ඒකකයේ ප්‍රමාණය පදනම් කරගෙන ඉඩම් කොටසක් මුලින් රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාර්ෂික බලපත්‍රයක් මත නොමිලයේ ලබාදීම හා එය සංවර්ධනය කර පදිංචිව සිටින බවට ප්‍රාදේශීය ලේකම් විසින් සෑහීමට පත්වූ පසුව නොමිලයේ දීමනා පත්‍රයක් ලබාදීම. එම නිදහස් දීමනා පත්‍රය ලබාදෙන තෙක් වාර්ෂික බලපත්‍රය වාර්ෂිකව අළුත් කලයුතු වේ. එහෙත් සාධාරණ කාලසීමාවක් තුල අදාල ඉඩමෙහි පදිංචි නොවුවහොත් වාර්ෂික බලපත්‍රය අළුත් නොකර මෙම ප්‍රතිලාභය අහිමි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය අනුව මවිසින් අවශ්‍ය පියවර ගනු ලැබේ.

## 2.1. ප්‍රතිලාභ -

පදිංචියට ඉඩමක් නොමැති හා 2009.06.01 දිනට පෙර සේවයට බැඳී ඇති නිලධාරීන් හා සෙබළුන්ටත් මියගිය එවැනි නිලධාරීන් හා සෙබළුන්ගේ පවුලේ යැපෙන්නන්ටත් මෙම වැඩසටහන යටතේ සහන/ප්‍රතිලාභ හිමි වේ.

පහත සඳහන් ආකාරයට මෙම ප්‍රතිලාභ හිමිවේ.

අ) ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී මියගිය හෝ අතුරුදහන් වූ රණවිරුවන්ගේ පවුලේ ළඟම ඥාතියකුට (විවාහක නම් කලත්‍රයාට හෝ කලත්‍රයා නොමැතිනම් අවිවාහක එක් දරුවකුටත්, අවිවාහක නම් මව හෝ පියාටත්) සහ ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වූ රණවිරුවන්ට පදිංචිය සඳහා සාමාන්‍යයෙන් ඉඩම් බෙදා දීමේදී සැලකිල්ලට ගනු ලබන ඉඩම් ඒකකයේ ප්‍රමාණය පදනම් කරගෙන ඉඩම් කොටසක් මුලින් රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාර්ෂික බලපත්‍රයක් මත නොමිලයේ ලබාදීම හා එය සංවර්ධනය කර පදිංචිව සිටින බවට ප්‍රාදේශීය ලේකම් විසින් සෑහීමට පත්වූ පසුව නොමිලයේ දීමනා පත්‍රයක් ලබාදීම. එම නිදහස් දීමනා පත්‍රය ලබාදෙන තෙක් වාර්ෂික බලපත්‍රය වාර්ෂිකව අළුත් කලයුතු වේ. එහෙත් සාධාරණ කාලසීමාවක් තුල අදාල ඉඩමෙහි පදිංචි නොවුවහොත් වාර්ෂික බලපත්‍රය අළුත් නොකර මෙම ප්‍රතිලාභය අහිමි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය අනුව මවිසින් අවශ්‍ය පියවර ගනු ලැබේ.

ආ) ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය රණවිරුවන්ගේ පවුලේ ළඟම ඥාතියකුට (විවාහක නම් කලත්‍රයා හෝ කලත්‍රයා නොමැති නම් අවිවාහක එක් දරුවකුටත්, අවිවාහක නම් මව හෝ පියාටත්), සහ ක්‍රියාන්විත සේවයේ යෙදී සිට විශ්‍රාම ගිය රණවිරුවන්ට, අර්ධ ආබාධිත රණවිරුවන්ට සහ දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන් ලෙස අර්ථකතනය කර ඇති පුද්ගලයින් සඳහා බෙදාදෙනු ලබන ඉඩම් ඒකකය අනුව අදාල ඉඩමේ නොදියුණු තක්සේරු වටිනාකමින් 10% ක මුදලක් තක්සේරු වටිනාකම ලෙස සලකා දීර්ඝකාලීන බදු ක්‍රමයට ලබාදීමත් ඉඩම නිසි පරිදි සංවර්ධනය කර පදිංචි වීමෙන් පසුව හා 10% ක් වූ තක්සේරු වටිනාකම සම්පූර්ණයෙන් ගෙවා අවසන් කිරීමෙන් පසුව රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනාපත්‍රයක් ලබාදීම දීර්ඝකාලීන බදුකරයක් නිකුත් කල පසුව හෝ බදු අනුමැතිය ලබාදී ඉඩමේ භුක්තිය භාරදීමෙන් පසුව සාධාරණ කාලයක් තුල ඉඩමේ පදිංචිව නැති බවට අදාල ප්‍රාදේශීය ලේකම් විසින් සෑහීමට පත්වන්නේ නම් ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සැලකිල්ලට ගෙන එම බදුකරය හෝ බදු අනුමැතිය අවලංගු කිරීම සඳහා මවිසින් අවශ්‍ය පියවර ගනු ලැබේ.

ඉහත පරිදි නිදහස් දීමනාපත්‍රයක් හෝ දීමනාපත්‍රයක් ලබාදීමේදී වසර 5ක් ගතවන තුරු ප්‍රතිලාභියාගේ පවුලෙන් පිටතට දීමනාපත්‍රයේ අයිතිය බැහැර කල නොහැකිවනසේ කොන්දේසියක් ඇතුලත්කරනු ලැබේ.

මෙම සංශෝධිත ප්‍රතිලාභ/සහන අමාත්‍ය මණ්ඩල තීරණය ගනු ලැබූ 2016.08.16 දිනට පෙර ගරු ඉඩම් අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති දීර්ඝකාලීන බදුකර හෝ දීමනාපත්‍ර ඉල්ලීම් සඳහා අදාල කරගනු නොලැබේ.

## 2.2. බෙදාදීම සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම -

ආරක්ෂක අමාත්‍යාංශය සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය විසින් බෙදාදීම සඳහා සුදුසු ඉඩම් අවශ්‍ය ප්‍රදේශවලින් හඳුනාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සම්බන්ධීකරණය කිරීමත්, ඉන් අනතුරුව එම ඉඩම් බෙදාදීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා ත්‍රිවිධ හමුදා, පොලිස් දෙපාර්තමේන්තුව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ රණවිරු සේවා අධිකාරිය යන ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමත් සිදුකළ යුතුයි.

## 2.3. තෝරා ගැනීමේ ක්‍රමවේදය සහ ඉඩම සංවර්ධනය කිරීම සම්බන්ධ කොන්දේසි -

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් අදාල ආයතන සමඟ සාකච්ඡා කර ඉදිරියේදී හඳුන්වා දෙනු ලැබේ. ඉඩම සංවර්ධනය කිරීමට අදාලව කොන්දේසි මාලාවක්ද ඉදිරියේදී හඳුන්වා දෙනු ලැබේ.

**2.4. අයදුම්පත් සඳහා නිර්දේශ ලබා ගැනීම -**

මෙම චක්‍රලේඛය යටතේ හිමිකම් ලබන අයදුම්කරුවන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් පහත සඳහන් ආයතනවලින් නිර්දේශ ලබා ගත යුතුය.

I. ක්‍රියාන්විතයේදී මියගිය, අතුරුදහන් වූ සහ පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වූ ත්‍රිවිධ හමුදා රණවිරු පවුල් සඳහා රණවිරු සේවා අධිකාරිය මඟින්

II. සේවයේ යෙදී සිටින, විශ්‍රාමික හා අනෙකුත් හේතූන් මත මියගිය හෝ ආබාධිත වූ ත්‍රිවිධ හමුදා රණවිරු පවුල් සඳහා හමුදා මූලස්ථාන නිර්දේශ මත, ආරක්ෂක අමාත්‍යාංශයේ සන්නද්ධ හමුදා සුභ සාධන අංශය මඟින්

III. පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුව මඟින්

IV. සිවිල් ආරක්ෂක සේවා නිලධාරීන් සම්බන්ධයෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින්

නිර්දේශිත අයදුම්පත් ඉඩම් බෙදාදීමේ පරීක්ෂණ සඳහා ඉඩම් කච්චේරි පැවැත්වීමට අදාල ප්‍රාදේශීය ලේකම්වරයා වෙත යොමු කිරීම නිර්දේශ ලබා දෙන ආයතන මඟින් සිදු කල යුතුය.

**3. දැනට පවතින චක්‍රලේඛවල බලාත්මකභාවය**

මෙම ඉඩම් බෙදා දීමේ වැඩසටහනද ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ දැනට බලාත්මක චක්‍රලේඛ උපදෙස්වලට යටත්ව ක්‍රියාත්මක විය යුතු අතර, ලබා දෙනු ලබන ඉඩම් ප්‍රමාණය තීරණය කිරීම අදාල ප්‍රදේශයේ පළාත් පාලන ආයතන විසින් පනවා ඇති සීමාවන්ට හා පළාත් සභා විසින් නියම කර ඇති උපරිම සීමාවන්ට අනුකූලව නිර්ණය කළ යුතුය.